# නොච්චියගම සහ කැබිතිගොල්ලෑවේ පැවැත්වූ සමූපකාර සාකච්ඡා සභා.

# Co-operative Conferences at Nochchiyagama and Kebitigollewa.

මෙහි පහත පෙණෙන යෝජනාව මේ සාකච්ඡා සභාවේදී සම්මතකරගන්ට යෙදුනාය.

"මේ ගම්වල පළතුරු හා එළවලු වැවීමට ගොඩ ඉඩම් ගම්මුන්ට විකුණන විට ඒවායේ මුදල අවුරුදු පහක කාලයක්තුලදී ගෙවීමට ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් අවසරදීම සෑහේය යනුයි."

මීට ඒජන්ත උන්නාන්සේ විසින් එක්සත් සමාගම්වල රිජිස්ට්‍රාර් උන්නාන්සේ වෙත එවා තිබෙන උත්තරය නම් "එයාකාර ප්‍රස්ථාවලදී පහසු ක්‍රමයකට මුදල් ගෙවීමට ඉඩම් දීමට සතුටුය. මේ පළාතේ ඉඩම් මිළ බොහොම අඩු නිසා මුදල් ගෙවීමට එපමණ දීඝ කාලයක්වූ අවුරුදු පහක කාලයක් ඕනවනවා කියා මම නොසිතමි" කියාය.

කැබිතිගොල්ලෑවේ සමූපකාර සාකච්ඡා සභාවේදී "කුන්චුට්ටු කෝරළේට ආදර්ශ ගොවිපලක් පිහිටුවා ගොවීන්ගේ ගොවිතැන දියුණුකළ යුතුය" යන යෝජනාව සම්මතකරගන්ට යෙදුනේය. මේ යෝජනාව ගොවිකර්මාන්ත දෙපාර්තමේන්තුවේ ප්‍රධානතුමා වෙත සමූපාකාර සමාගම් සම්බන්ධ රිජිස්ට්‍රාර්තුමන් විසින් යවන්ට යෙදුනෙන් ඊට උත්තර ලැබී තිබෙන්නේ මෙසේය. "සුලු සුලු වශයෙන් දුරස්ථානවල කුඩා ආදර්ශ ගොවිපලවල් පිහිටුවීම ගැණ මම වඩා කැමති නැත. එම නිසා කුන්චුට්ටුවේ දැනට එයාකාර ගොවිපලක් පිහිටුවන්ට නුපුළුවන" කියාය.

( සමාගම්වල දැනගැණීම පිණිස ප්‍රසිද්ධකරනලදී. )